# ප්‍රසම්පාදන දැන්වීමයි

## ජාතික ලුණු සමාගම - ශ්‍රී ලංකාව

### (කර්මාන්ත අමාත්‍යාංශය)

**අලිමංකඩ ලුණු ලේවාය සඳහා**
**නව මේස ලුණු යන්ත්‍රාගාරයක් - 5 MT/H**
**(පිරිපහදු කිරීම සහ නිදහසේ ගලායන) සපයා, ගෙනැවිත් භාරදී,**
**ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීම**

**අංක : SL/NSL/TSP/2023/01**

01. ජාතික ලුණු සමාගම වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකාවේ, අලිමංකඩ ලුණු ලේවාය සඳහා නව මේස ලුණු යන්ත්‍රාගාරයක් – 5 මෙට්‍රික් ටොන් / පැයට සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කොට, ක්‍රියාත්මක කිරීම සඳහා, සුදුසුකම්ලත් හා නිපුණතා පූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය හරහා ලංසු කැඳවීම සිදු කරනු ඇත. ජාත්‍යන්තර නිෂ්පාදනයේ දේශීය ඒජන්තවරු විසින් ලංසු ලියවිල්ල සමග නිෂ්පාදකයාගේ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

03. ආපසු ගෙවනු නොලබන ගාස්තු වශයෙන් ශ්‍රී ලංකා රුපියල් විසිදෙදහසක් (ශ්‍රී ලංකා රුපියල් – 22,000/–) හෝ ඇමරිකන් ඩොලර් 85 ක් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, ජාතික ලුණු සමාගමේ සාමාන්‍යාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් තමන්ගේ ව්‍යාපාර ලිපි ශීර්ෂයක් මගින් ඉදිරිපත් කිරීමෙන්, සාමාන්‍ය රාජකාරී දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ, 2023 මාර්තු 14 දින දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ලංසු ලේඛන ගෙන්වා ගැනීමට අවශ්‍ය වෙතොත් ඉහත ලිපිනයට ලිඛිත ඉල්ලීමක් සමග ශ්‍රී ලංකා රුපියල් 4,000/– වටිනා ජාතික ලුණු සමාගම නමට ගත් බැංකු අණකරයක් (දේශීයව ලබාදීම සඳහා) හෝ ඇමරිකන් ඩොලර් 60 (විදේශයන්ට යැවීම සඳහා) මගින් ගෙවිය යුතුය. අදාළ ලංසු ලේඛන, අයදුම්කරු විසින් සඳහන් කරනු ලබන ලිපිනය වෙත සීඝ්‍ර දූත සේවය මගින් එවනු ලැබේ. ගෙනැවිත් භාරදීමේදී අස්ථානගත වන හෝ ප්‍රමාදවීම් සම්බන්ධව ආයතනයේ වගකීමක් නොමැත.

04. මුද්‍රා තැබූ ලංසු, පහත සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ සීඝ්‍ර දූත සේවය මගින් එවීමෙන්, 2023 මාර්තු 15 වන දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, පහත සඳහන් ලිපිනයේදී, 2023 මාර්තු 15 වන දින පස්වරු 2.00 ට, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග, ලංසු දත්ත පතෙහි (BDS) සඳහන් උපදෙස් පරිදි, ජාතික ලුණු සමාගම නමට ගත් වටිනාකම රුපියල් දහඅට ලක්ෂයක් (ශ්‍රී ලංකා රුපියල් 1,800,000/–) හෝ ඇමරිකන් ඩොලර් පන්දහස් එකසිය පනහක් (ඇ.ඩො. 5150) වටිනා ලංසු ඇපකරය බැංකු අණකරයක් මගින් තිබිය යුතුය.


**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**

**ජාතික ලුණු සමාගම**

**561/3, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05, ශ්‍රී ලංකාව.**

**දුරකථන : +94-112368964 / +94-112368998 / +94-112368974 ෆැක්ස් : +94 - 112368974**
**ඊමේල් : nslhoc@gmail.com**